# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 අගෝස්තු මස 23 වන දින

## II වන කොටස

## අතිරේකය

## (2024.08.26 දින නිකුත් කරන ලදී)


# ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

## ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) මධුර විතානගේ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 30.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

### ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

*පූර්විකාව*

"ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සහ පදනමක්, එම පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනමට සම්බන්ධ සියලු කරුණු එලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබූවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින්ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස යෝග්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

1. මේ පනත 2024 අංක    දරන ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම*

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාපිත මණ්ඩලයට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) "ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු ය. තවද එකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## ටෙ‍්ඩ්සෝ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** (1) සංස්ථාපිත මණ්ඩලය පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) ග්‍රාමීය සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට, මූල්‍යකරණයට, ක්‍රියාත්මක කිරීමට සහ පවත්වාගෙන යාමට, ප්‍රජාවන්ට, පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට, රාජ්‍ය නොවන සංවිධානවලට සහ වෙනත් ඕනෑම සිවිල් සමාජ සංවිධානවලට අවශ්‍යවන්නා වූ මූල්‍ය සහ/ හෝ වෙනත් අනුග්‍රහයන් සහ සහායන් ලබා දීම;

(ආ) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන්ගේ යහපැවැත්ම සහ ආදායම් මට්ටම වැඩිදියුණු කිරීමට අරමුදල් සැපයීම මඟින් සහය වීම සහ එකී ප්‍රජාවන්ගේ/ පුද්ගලයින්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සහ තිරසාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, එම ව්‍යාපෘති පරිපාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ඇ) ගොවීන්ගේ සහ නිෂ්පාදකයින්ගේ සුභසිද්ධිය සඳහා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සහ ග්‍රාමීය කර්මාන්ත නිමැවුම් මිලදී ගැනීම අපනයනය, බෙදා හැරීම ඒවා සඳහා වෙළෙඳපොළ සකස් කිරීම ඇතුළු අනෙකුත් කටයුතු සඳහා පහසුකම් සැලසීම;

(ඈ) වෘත්තීය පුහුණුව ඇතුළු අධ්‍යාපන සඳහා ප්‍රජාවන්ට සහය වීම සහ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම;

(ඉ) ග්‍රාමීය මට්ටමේ සංවර්ධන වැඩසටහන් සඳහා සහාය වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම;

(ඊ) ජාත්‍යන්තරව මූල්‍ය ආධාර, ප්‍රදාන, පරිත්‍යාග, ණය සහ ආයෝජනයන් ලබා ගැනීම;

රජයේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කටයුතු සමඟ ගැටුම් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව

**4.** සංස්ථාපිත මණ්ඩලය විසින් සිය පරමාර්ථ ලිඛිත නීතිවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු අතර, එම පරමාර්ථ, ආණ්ඩුවේ යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් හෝ යම් පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් ඊට සමගාමීව කරගෙන යනු ලබන ක්‍රියාවක් සමඟ ගැටුම් සහගත තතත්වයක් ඇති නොවන ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතුය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලන කිරීම, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලබන ධුර දරන්නන්ගෙන් සමන්විත වන (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) විධායක කමිටුවක් විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරනු ලබන පදනමේ කමිටුවේ සාමාජිකයින් (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම කමිටුව පත් කරනු ලබන තෙක් හෝ තෝරා පත්කර ගනු ලබන තෙක්, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු කමිටුව ලෙස කටයුතු කළ යුතු අතර කමිටුවේ පළමු සාමාජිකයින් වනුයේ :-

තුසිත චන්ද්‍රපද්ම කන්නන්ගර මහතා
අලම්පොල ආරච්චිගේ දුමින්ද චන්න රණසිංහ මහතා
ධම්මිකා කන්නන්ගර මහත්මිය
දිනේෂ් ඩෙනිස් උඩුවෙල මහතා
තවීෂ දිල්රංග කන්නන්ගර මහතා
කුමාරගේ දොන් චමිල චතුරන් ජීවන්ත සිල්වා මහතා

(ආ) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි සංස්ථාපිත මණ්ඩලයේ අතුරු කමිටුව සඳහා සහ සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීම සඳහා රීති සෑදීමට සංස්ථාපිත මණ්ඩලයේ අතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත්තේ ය.

(ඇ) අතුරු කමිටුවේ යම් තීරණයක් එම රැස්වීම සඳහා පැමිණ සිටින සාමාජිකයින්ගේ එකඟතාව මත ගනු ලැබිය යුතු ය.

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට අවුරුද්දක කාලයක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම කමිටුව පත් කිරීම හෝ තොරා පත් කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන්, උපදේශකවරුන් සහ කමිටුවේ සාමාජිකයින් ද ඇතුළුව සංස්ථාපිත මණ්ඩලයේ සෑම ධුර දරන්නකුම පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු වේ. ධුර දරන්නන්ගේ ධුර කාලය අවුරුදු තුනක් වන අතර එම අවුරුදු තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව ඒ ධුර දරන්නා, අනුශාසකරවරයා හෝ උපදේශකවරයා නැවත පත් කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීමට සුදුස්සකු වන්නේ ය.

(ආ) යම් ධුර දරන්නකු මියයාම, ඔහුගේ කායික හෝ මානසික අශක්නුතාවය, අකාර්යක්ෂමතාවය, ඔහු සංස්ථාපිත මණ්ඩලයෙන් ඉල්ලා අස්වීම හෝ සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු පිළිගැනීම අවසන් කිරීම යන හේතු මත ධුරයෙන් ඉවත් වීම හෝ කමිටුව විසින් බහුතර ඡන්දයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, කමිටුව විසින් සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා ගැනීම හෝ තෝරා පත් කර ගැනීම කළ යුතු ය.

(ඇ) කමිටුවේ සාමාජිකයින් පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම වාර්ෂික මහා සභා රැස්වීමකදී සිදු කළ යුතු ය.

(ඈ) ඉහත (ආ) ඡේදය යටතේ තෝරාගත් හෝ තෝරා පත්කරගනු ලැබූ තැනැත්තන් ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පත් කරගැනීමේ කාර්යය සඳහා පහත සඳහන් සියලු ක්‍රියා සහ කාරණා කිරීමේ, ඉටුකිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය :-

(අ) දැනට පවතින හෝ කලින් කලට නීතියෙන් පැනවිය හැකි ඕනෑම සීමාවකට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම්, ගොඩනැගිලි,

වාහන, යන්ත්‍ර සූත්‍ර, වත්කම්, සුරැකුම්පත්, පහසුකම් සහ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් තැන්වල ඕනෑම අයිතිවාසිකම් බලපත්‍ර හෝ වරප්‍රසාද ඇතුළු ඕනෑම චංචල හෝ නිශ්චල දේපළක් දේශීයව හෝ විදේශීය ව මිලයට, කුලියට, බදු ගැනීමක් හෝ හුවමාරුවක් ලෙස ලබා ගැනීමට හෝ අන්‍යාකාරයෙන් අත්පත් කර ගැනීමටත්, ඒවා පවත්වාගෙන යාම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීමට සහ ඒවා සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමටත්, සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු සහ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා, කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම, පැවරීම හෝ වෙනත් කුමන හෝ ආකාරයකට බැහැර කිරීම සහ ඒ සඳහා ක්ෂය අරමුදලක්, සංචිත හෝ නිදන් අරමුදලක් ඇති කිරීම:

එසේ වුව ද කිසියම් භාරයකට යටත් විය හැකි යම් දේපළක් සංස්ථාපිත මණ්ඩලය විසින් ලබා ගන්නේ නම් හෝ තබා ගන්නේ නම්, එම භාරයන් සම්බන්ධයෙන් ගනුදෙනු කිරීම හෝ ආයෝජනය කිරීම නීතියෙන් අවසර දී ඇති ආකාරයට පමණක් සිදු කළ යුතු අතර, ඒ ආකාරයෙන් සංස්ථාපිත මණ්ඩලය සතු වූ දේපළ බැහැර කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව ලිඛිත අධිකාරිය හෝ අනුමැතිය හෝ නොමැතිව එම දේපළ විකිණීම, උකස් කිරීම, භාරකරත්වය පැවරීම හෝ බදු දීම නොකළ යුතුය. එවැනි ඕනෑම කටයුත්තක් සම්බන්ධයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කමිටුව ඔවුන්ගේ ක්‍රියාවන්, නොසලකා හැරීම් සහ පැහැර හැරීම් සඳහා වගකිව යුතු සහ වගවිය යුතු ය;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය හෝ පහසු විය හැකි ඕනෑම ගොඩනැගිල්ලක්, මාර්ගයක්. කම්හලක්. යන්ත්‍රෝපකරණයක් සහ ඕනෑම වත්කමක් ඇති කිරීම, ඉදිකිරීම, විශාල කිරීම, සංවර්ධනය කිරීම, වෙනස් කිරීම සහ නඩත්තු කිරීම;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා, ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම සහ රැස් කිරීම සහ ප්‍රදාන, ත්‍යාග, පරිත්‍යාග හෝ ප්‍රතිලාභ වශයෙන්,

මුදලින් හෝ චංචල හෝ නිශ්චල දේපළ ලෙස කිසියම් පුද්ගලයකුගෙන්, සංවිධානයකින් හෝ විශේෂ භාරයකින් අරමුදල් ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය වෙත ලබා දෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කමිටුව විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු අතර කිසියම් භාරයකට යටත් විය හැකි යම් දේපළක් සංස්ථාපිත මණ්ඩලය විසින් ලබා ගන්නේ නම් හෝ තබා ගන්නේ නම්, එම භාරයන් සම්බන්ධයෙන් ගණුදෙනු කිරීම හෝ ආයෝජනය කිරීම නීතියෙන් අවසර දී ඇති ආකාරයට පමණක් සිදු කළ යුතු ය.

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් දීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි යම් බැංකුවක හෝ බැංකුවල ගිණුම් විවෘත කිරීම. ක්‍රියාත්මක කිරීම, පවත්වා ගෙන යාම සහ වසා දැමීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා, ඕනෑම පුද්ගලයෙකුට, සංවිධානයකට හෝ විශේෂ භාරයකට සුදුසු පරිත්‍යාග, ත්‍යාග, සහනාධාර, සහාය සහ වෙනත් ආධාර ලබා දීම:

එසේ වුව ද, වෘත්තීය සමිතිවල අරමුණු, ඒ හා සමාන වන්නා වූ අරමුණු ප්‍රවර්ධනය හෝ ඒ හා සම්බන්ධිත හෝ ආශ්‍රිත කටයුතු ප්‍රවර්ධනය කිරීමට හා ඒවා සඳහා කිසියම් ආධාර, උපකාර හෝ ප්‍රසම්පාදන සැලසීම සඳහා සංස්ථාපිත මණ්ඩලය සිය අරමුදල් යොදා නොගත යුතු අතර, කිසියම් භාරයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී සංස්ථාපිත මණ්ඩලය විසින්, එම භාරයන් සම්බන්ධයෙන් ගණුදෙනු කිරීම හෝ ආයෝජනය කිරීම නීතියෙන් අවසර දී ඇති ආකාරයට පමණක් සිදු කළ යුතු ය;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා වහා අවශ්‍ය නොවන යම් අරමුදල්, දැනට පනවා ඇති හෝ නීතියෙන්

නියම කළ හැකි කොන්දේසි වලට යටත්ව, නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් මූල්‍ය ආයෝජන, සුරැකුම්පත් හෝ දේපළ යන කුමන ආකාරයකින් හෝ ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සෘජු හෝ වක්‍ර පරමාර්ථ ඇති යම් නීත්‍යනුකූල භාරයකින් හෝ ආයතනයකින් එකී භාරය හෝ නිශ්චල හෝ චංචල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම:

එසේ වුව ද, කිසියම් භාරයකට යටත් වන්නා වූ යම් දේපළක් සංස්ථාපිත මණ්ඩලය විසින් ලබා ගන්නේ හෝ පවරාගන්නේ හෝ තබා ගන්නේ හෝ නම්, එකී දේපළ සම්බන්ධයෙන් සංස්ථාපිත මණ්ඩලය විසින් ගනුදෙනු කිරීම හෝ ආයෝජනය කිරීම සිදු කළ යුත්තේ එම භාරය සම්බන්ධයෙන් නීතියෙන් අවසර දී ඇති ආකාරයට පමණි;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා, ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම පුද්ගලයෙකු සමඟ ඕනෑම ආකාරයේ සම්මුතිවලට හෝ ගිවිසුම්වලට එළඹීමට සහ රජය. පළාත් සභා, පළාත් පාලන ආයතන හෝ අවශ්‍ය විය හැකි වෙනත් ඕනෑම අධිකාරියක් වෙතින් අනුමැතිය, බලපත්‍ර, සහන, වරප්‍රසාද සහ ප්‍රදාන ලබා ගැනීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු ඉටු කිරීම සඳහා සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන් විෂයයෙහි සේවය අවසන් කිරීම සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා, විශ්‍රාම වැටුප්, අර්ථසාධක අරමුදල්, වෙනත් ආධාර හෝ ප්‍රදාන සහ පාරිතෝෂික ගෙවීම;

(එ) සංස්ථාපිත මණ්ඩලය පිහිටුවීම, ප්‍රවර්ධනය සහ පවත්වාගෙන යාමට අදාළ වූ සියලු වියදම් ගෙවීම;

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු සහ කාර්යය ප්‍රවර්ධනය කිරීම සඳහා ඕනෑම පුද්ගලයකු ආයතනික පිරිවැය සහ වියදමින් ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි පුහුණු කිරීම;

(ඔ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයන්හි ප්‍රදර්ශන, උත්සව, සම්මන්ත්‍රණ, වැඩමුළු, කණ්ඩායම් අධ්‍යයන, දේශන සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය දැක්වීම සහ පැවැත්වීම;

(ඕ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ සහ අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා යෝග්‍ය යැයි සැලකෙන පොත්, සඟරා පත්‍රිකා, පුවත්පත්, යනාදිය මුද්‍රණය කිරීම, ප්‍රකාශ කිරීම සහ බෙදා හැරීම;

(ක) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු සහ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සාමාජිකත්ව අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ත්‍යාග, ශිෂ්‍යාධාර සහ වෙනත් සම්මාන ප්‍රදානය කිරීම;

(ග) සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා සංස්ථාපිත මණ්ඩලයේ සේවයේ නියුක්තිකයින් සඳහා නවාතැන්, වෙනත් පහසුකම් සහ ප්‍රදාන ලබා දීම;

(ච) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති වෙනත් ආයතන සමඟ සහයෝගීතාවය, ඒකාබද්ධ වීම, ආධාර සැපයීම ප්‍රවර්ධනය කිරීම හෝ එවැනි ආයතන හෝ සංවිධාන පිහිටුවීමට කටයුතු සිදු කිරීම;

(ජ) සංස්ථාපිත මණ්ඩලයේ සහ එහි නිලධාරීන්ට එරෙහි නීතිමය ක්‍රියාදාමයන්වලදී ඔවුන්ව ආරක්ෂා කිරීම, මැදිහත් වීම සහ සම්මුතියන් ඇති කිරීම සහ සංස්ථාපිත මණ්ඩලයේ හෝ එහි නිලධාරීන්ගේ නිල ක්‍රියාවන්ට අභියෝග කරන්නා වූ වෙනත් පාර්ශ්වයන්ට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීම හෝ මැඩපැවැත්වීම; සහ

(ට) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු සහ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයන්හි, ශාඛා පිහිටුවා පවත්වා ගෙන යාම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් සහ කමිටුවේ අවසාන තීරණය

අනුව, පහත සඳහන් සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල විය යුතු ය:-

(අ) කමිටුවේ තීරණයට යටත්ව, සංස්ථාපිත මණ්ඩලය සඳහා සුදුසු පරිදි සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම, සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයින්ගේ ඡන්ද අයිතිය සහ වගකීම, සාමාජිකයින් සඳහා කොන්දේසි සහ නියමයන් සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු දායක මුදල් නිර්ණය කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ කමිටුවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුර දරන්නන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත්කිරීමේ නියම සහ කොන්දේසි, ඔවුන්ගේ බලතල, කාර්යය හා කර්තව්‍ය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ හෝ කමිටුවේ යම් රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය, එම රැස්වීම් පිළිබඳ දැන්වීම් හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) කමිටුවේ සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකුවීමට අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය සහ විදේශීය අනෙකුත් ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීමේ ආකාරය පාලනය කරනු ලබන කාර්යය පටිපාටිය; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනා කරණය කිරීම හා එහි පරමාර්ථ ඉටු කිරීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එම ආකාරයෙන්ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහ වාර්ෂික මහා සභා රැස්වීමකට හෝ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයින්ගෙන් හතරෙන් තුනක් අනුමත කර ඇත්නම් මිස සංස්ථාපිත මණ්ඩලයේ බලපවත්නා ව්‍යවස්ථාවේ හෝ පරමාර්ථ ප්‍රකාශයේ විධිවිධානවලට කිසිදු එකතු කිරීමක්, වෙනස් කිරීමක් හෝ සංශෝධනයක් සිදු නොකළ යුතු ය.

(3) (1) වන වගන්තිය යටතේ සාදනු ලැබූ රීති එකී රීති සාදනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළ කරනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතුය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සැම කල්හි ම සංස්ථාපිත මණ්ඩලයේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය සහ අනෙකුත් ලේඛන

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපිනය සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ ලේඛනයක්, විධායක කමිටුවේ පත්වීම්, විධායක කමිටුවේ රැස්වීම් සඳහා සහභාගිවීම් සහ එම රැස්වීම්වලදී සම්මත කරන ලද යෝජනා සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු ලේඛන කමිටුව විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හා ප්‍රදාන වශයෙන් ලැබුණු සියලු මුදල්, 6 (ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේදී හා ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කෙසේ වුව ද, වෘත්තීය සමිතිවල අරමුණු හා සමාන වන්නා වූ අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් හෝ වෙනත් අය සඳහා සංස්ථාපිත මණ්ඩලයේ අරමුදලින් කිසිදු ගෙවීමක් නොකළ යුතු ය.

**ගිණුම් සහ විගණනය**

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය එක් වර්ෂයක අප්‍රේල් මස පළමු වන දින සිට ඊළඟ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දින දක්වා විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) දැනට පවතින නීතියට සහ මෙම පනතට අනුව පනවනු ලැබිය හැකි ඕනෑම සාධාරණ සීමාවන්ට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් අවම වශයෙන් සෑම වසරකටම වරක්වත් සාමාජිකයන්ගේ පරීක්ෂාව සඳහා විවෘතව තිබිය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් සහ ශේෂ පත්‍රය, සමාගම් පනතෙහි 156 සිට 159 දක්වා වූ වගන්තීන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව යටත්ව, විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත්කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු අතර විගණකාධිපතිවරයා හෝ එකී සුදුසුකම් ලත් විගණකවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන්

වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරිවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

(6) සංස්ථාපිත මණ්ඩලයේ මහා සභා රැස්වීමක දී ඉදිරිපත් කරනු ලබන සෑම ශේෂ පත්‍රයකම පිටපත් සහ ඒ සඳහා නීතියෙන් පනවා ඇති අනෙකුත් සියලුම ලියවිලි ද ඇතුළුව, විගණන වාර්තාවේ පිටපත් ද සමඟ එම මහා සභා රැස්වීම පැවැත්වෙන දිනට, දින විසි එකකට පෙර සංස්ථාපිත මණ්ඩලයේ සෑම සාමාජිකයකුටම ලබා දිය යුතු වේ.

වාර්ෂික වාර්තාව

**11.** (1) කමිටුව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහාම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය ද, විගණකාධිපතිවරයා හෝ 10 වගන්තියේ සඳහන් කරන ලද සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද සංස්ථාපිත මණ්ඩලයේ සියලු වත්කම් සහ වගකීම් පිළිබඳ ලැයිස්තුවක් ද සමග, වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ සමාජ සේවා කටයුතු විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය වෙත සහ 1980 අංක 31 දරන ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට, මුදල් වර්ෂය තුළ දී, සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක්, සංස්ථාපිත මණ්ඩලය විසින් එළඹෙන ලද සියලු ගිවිසුම් සහ එකඟතා පිළිබඳ විස්තර සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීති අමුණා තිබිය යුතු ය.

පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු මුදල්

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ ග්‍රාහක මුදල්, දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

**13.** (1) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට, මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව, නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මෙම පනතේ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද කිසියම් භාරයකට යටත් වන්නා වූ යම් දේපළක් සංස්ථාපිත මණ්ඩලය විසින් ලබාගන්නේ හෝ පවරාගන්නේ හෝ තබා ගන්නේ හෝ නම්, එකී දේපළ සම්බන්ධයෙන් සංස්ථාපිත මණ්ඩලය විසින් ගනුදෙනු කිරීම හෝ ආයෝජනය කිරීම සිදුකළ යුත්තේ එම භාරය සම්බන්ධයෙන් නීතියෙන් අවසර දී ඇති ආකාරයට පමණක් වන අතර, සංස්ථාපිත මණ්ඩලය සතු දේපළ බැහැර කිරීමේ දී සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව ලිඛිත අධිකාරිය හෝ අනුමැතිය හෝ නොමැතිව එම දේපළ විකිණීම, උකස් කිරීම, භාරකාරත්වය පැවරීම හෝ බදුදීම නොකළ යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම උදෙසා පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් සෘජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලයට සත්‍ය වශයෙන්ම කරන ලද කිසියම් සේවාවක් වෙනුවෙන් එහි විධායක කමිටුවේ හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයින් නොවන වෙනත් කිසියම් නිලධාරියකුට හෝ සේවකයකුට හෝ සාධාරණ හා නිසි වේතනයක් සද්භාවයෙන් ගෙවීම මෙයින් නොවැළැක්විය යුතු අතර, ඔවුනට මහ බැංකුව විසින් නිශ්චය කරන ලද පොලී අනුපාතිකය නොඉක්මවන සාධාරණ ගෙවීමක් කළ යුතු ය. සංස්ථාපිත මණ්ඩලයේ කළමනාකරණ සභාවේ හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයින් විසින් සංස්ථාපිත මණ්ඩලය වෙනුවෙන් දරන ලද යම් වියදමක් පමණක් ඔවුනට ප්‍රතිපූරණය කළ යුතු වේ:

තවද විධායක කමිටුවේ හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයකු වන සහ ප්‍රාග්ධනයෙන් සියයෙන් පංගුවකට වඩා හිමි නොවන සහ ලාභයේ කිසිදු කොටසකට හිමිකම්ගත කිරීමට බැඳී නොසිටින කිසිදු සමාගමක කිසිදු ගෙවීමක් සඳහා ඉහත සඳහන් ප්‍රතිපාදන අදාළ නොවේ.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**15.** සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකු, කමිටුවේ සාමාජිකයෙකු සහ ලේකම්වරයාගේ හෝ කමිටුව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් පුද්ගලයෙකු ඉදිරිපිට දී මිස, කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තවද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය හා බැරකම් ගෙවා සමථයකට පත් කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ

සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා උචිත ආයතනය හෝ ආයතන සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුවම, 1980 අංක 31 දරන ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයින් විසින් එහි මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(3)(2) වන උපවගන්තියේ ප්‍රකාරව කටයුතු කිරීමට අපොහොසත්ව සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැර ඇති අවස්ථාවක දී, පුණ්‍යාධාර අරමුදල් සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති විනිසුරුවරයෙකු හෝ රජයේ අධිකාරියක් විසින් ඉතිරි වන දේපළ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී එකී දේපළ උචිත ආයතනයක් හෝ ආයතන වෙත හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාපිත මණ්ඩලයක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවක් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.